*සැ. යු.-* (i) 2017.05.26 දින පළ වූ අංක 2021 දරන *ගැසට් පත්‍රයේ* II හා III කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,022 - 2017 ජූනි මස 02 වැනි සිකුරාදා - 2017.06.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... | 1008 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1010 |

*සැ. යු.-* (i) ආනන්ද අලුත්ගමගේ සංවර්ධන, සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 මැයි මස 26 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) විශේෂ තැන්පත් ගිණුම පනත් කෙටුම්පත 2017 මැයි මස 26 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) ඉලෙක්ට්‍රොනික ගනුදෙනු (සංශෝධන) පනත් කෙටුම්පත 2017 මැයි මස 26 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 ජූනි මස 23 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 ජූනි මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1005 - B 81175 — 5,403 (2017/06)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පෙ-ාතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙ-වත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලා-වකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩද-ාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෙ-ා්ජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩි-කෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරී-මෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේ-වකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## සංශෝධනයයි

## විගණකාධිපති දෙපාර්තමේන්තුව

## ශ්‍රී ලංකා විගණන සේවයේ I පන්තියේ I ශ්‍රේණියේ නියෝජ්‍ය විගණකාධිපති තනතුර - ලකුණු ලබාදීමේ පටිපාටිය සංශෝධනය කිරීම

2016 සැප්තැම්බර් 23 දිනැති අංක 1986 දරන *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කර ඇති ශ්‍රී ලංකා විගණන සේවයේ I පන්තියේ I ශ්‍රේණියේ නියෝජ්‍ය විගණකාධිපති තනතුරට සෘජු බඳවා ගැනීම සඳහා වූ අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ලකුණු ලබාදීමේ පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සංශෝධනය කරනු ලදුව, සංශෝධිත ලකුණු ලබා දීමේ පටිපාටිය දැන ගැනීම සඳහා පළ කරනු ලැබේ. තව ද, ඒ අනුව ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනය 2017 ජුනි 23 ලෙස සංශෝධනය කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

මානෙල් එස්. කපුකොටුව,
අධ්‍යක්ෂ (පාලන).

2017 මැයි මස 16 වැනි දින,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

**ශ්‍රී ලංකා විගණන සේවා ව්‍යවස්ථාවේ 3.1 (අ) ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා විගණන සේවයේ I පන්තියේ I ශ්‍රේණියේ නියෝජ්‍ය විගණකාධිපති තනතුරට බඳවා ගැනීම සඳහා වන ලකුණු පරිපාටිය**

01. *අතිරේක වෘත්තීය සුදුසුකම් :* උපරිම ලකුණු 25

*(අ)* මූලික සුදුසුකම්වලට අමතරව ගණකාධිකරණය හෝ;
විගණන ක්ෂේත්‍රයේ පූර්ණ වෘත්තීය සුදුසුකම් සඳහා (ලකුණු 10)

(i) ශ්‍රී ලංකාවේ හෝ එංගලන්තයේ සහ වේල්ස්හි වරලත් ගණකාධිකාරින්ගේ ආයතනයෙහි හෝ එක්සත් රාජධානියෙහි වරලත් කළමනාකරණ ගණකාධිකාරින්ගේ ආයතනයෙහි හෝ එක්සත් රාජධානියෙහි සහතිකලත් ගණකාධිකාරින්ගේ වරලත් සංගමය යන ආයතන 3හිම ආශ්‍රිත සාමාජිකත්වය ලබා ඇති අයදුම්කරුවෙකු සඳහා මූලික සුදුසුකමට අමතරව අතිරේක වෘත්තීය සුදුසුකම් 2ක් ලබා ඇති බව සලකා ඒ සඳහා, ලකුණු 10ක් ලබා දේ.

(ii) ශ්‍රී ලංකාවේ හෝ එංගලන්තයේ සහ වේල්ස්හි වරලත් ගණකාධිකාරින්ගේ ආයතනයෙහි හෝ එක්සත් රාජධානියෙහි වරලත් කළමනාකරණ ගණකාධිකාරින්ගේ ආයතනයෙහි හෝ එක්සත් රාජධානියෙහි සහතික ලත් ගණකාධිකාරින්ගේ වරලත් සංගමය යන ආයතන 3න් 2ක ආශ්‍රිත සාමාජිකත්වය ලබා ඇති අයදුම්කරුවෙකු සඳහා මූලික සුදුසුකමට අමතරව තවත් එක් අතිරේක වෘත්තීය සුදුසුකමක් ලබා ඇති බව සලකා ඒ සඳහා, ලකුණු 05ක් ලබා දේ.

*(ආ)* ඉහත ක්ෂේත්‍රයන්ට අමතරව වෙනත් ක්ෂේත්‍රයක හෝ නීති ක්ෂේත්‍රයේ වෘත්තීය සුදුසුකම් සඳහා (ලකුණු 10).

(i) වෛද්‍ය, ඉංජිනේරු හෝ නීති යන ක්ෂේත්‍ර අතරින් ක්ෂේත්‍ර 02ක වෘත්තීය සුදුසුකම් ලබා ඇත්නම් ලකුණු 10ක් ලබා දේ.

(ii) වෛද්‍ය, ඉංජිනේරු හෝ නීති යන ක්ෂේත්‍ර අතරින් එක ක්ෂේත්‍රයක වෘත්තීය සුදුසුකම් ලබා ඇත්නම් ලකුණු 05ක් ලබා දේ.

*(ඇ)* තොරතුරු තාක්ෂණය පිළිබඳ වෘත්තීය සුදුසුකම් සඳහා (ලකුණු 05)

(i) තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධිය සඳහා ලකුණු 05ක් ලබා දේ.(පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ SLITT/NIBM ලබා ඇති).

(ii) වසරකට වැඩි කාලයක් ආවරණය වන තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව (පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ SLITT/NIBM) සඳහා ලකුණු 03ක් ලබා දේ.

02. *අධ්‍යාපනික සුදුසුකම් :*

| | |
|---|---|
| ආචාර්ය උපාධිය | ලකුණු 25 |
| එම්.ෆිල්. උපාධිය | ලකුණු 20 |
| පශ්චාත් උපාධි, එම්. එස්. සී./එම්. ඒ. | ලකුණු 18 |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | ලකුණු 15 |
| පන්ති සාමාර්ථයක් සහිත උපාධිය | ලකුණු 12 |
| (i) පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | ලකුණු 12 |
| (ii) දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා | ලකුණු 10 |
| (iii) දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා | ලකුණු 08 |
| විශේෂ උපාධිය | ලකුණු 10 |
| සාමාන්‍ය උපාධිය | ලකුණු 08 |
| ඩිප්ලෝමා | ලකුණු 05 |

*සටහන 01*

උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ.

*සටහන 02*

ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන්නේ ගණකාධිකරණය හෝ විගණන ක්ෂේත්‍රයට අදාළව නම් උපරිම සුදුසුකම්වලට අමතරව, තවත් ලකුණු 02ක් ලබා දේ.

03. *පළපුරුද්ද :* උපරිම ලකුණු 40

*(අ)* බාහිර අයදුම්කරුවන් සඳහාවන මූලික සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් වසර 08ක සේවා කාලයට පසුව එළඹෙන සෑම වසරකටම ලකුණු 05 බැගින්.

*(ආ)* අවුරුදු 08ක මාණ්ඩලික ශ්‍රේණියේ පළපුරුද්ද ඇති රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/සංස්ථා සේවයේ නියුතු නිලධාරීන් මූලික සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් වසර 04ක සේවා කාලයට පසු එළඹෙන සෑම වසරකටම ලකුණු 05 බැගින්.

*(ඇ)* විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විගණන සේවයේ අවුරුදු 08ක සේවයක් ඇති ශ්‍රී ලංකා විගණන සේවයේ නිලධාරීන් සඳහා මූලික සුදුසුකම් ලබා ගැනීමෙන් පසු එළඹෙන සෑම වසරකටම ලකුණු 05 බැගින්.

04. *සම්මුඛ පරීක්ෂණය සඳහා* උපරිම ලකුණු 10

*සැ. යු.-* ලකුණු ලබාදීමේ දී සලකා බලන සුදුසුකම්/කුසලතා සම්මුඛ පරීක්ෂණ උපලේඛනයේ සඳහන් කළ යුතුය.

06-79

---

## පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

### ඉංග්‍රීසි ලඝුලේඛක තනතුරු 02

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයට ඉංග්‍රීසි ලඝුලේඛක තනතුරු 02 ක් සඳහා බඳවා ගැනීමට ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

ඉංග්‍රීසි ලඝුලේඛක - (අනියම් පදනම)

1. *අධ්‍යාපන සුදුසුකම් :*
   - (i) සිංහල / දෙමළ, ගණිතය හා ඉංග්‍රීසි භාෂාව විෂයයන් සඳහා සම්මාන සහිතව එකවර විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙළ) සමත්වී තිබීම. අ.පො.ස (උ.පෙළ) සමත්ව තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.
   - (ii) ඉංග්‍රීසි ලඝුලේඛනය විනාඩියකට වචන 80ක වේගයෙන් සටහන් කර ගැනීමට හැකිවිය යුතු ය.
   - (iii) ඉංග්‍රීසි භාෂාවෙන් පරිගණක වදන් සැකසුම් හැකියාව තිබිය යුතු ය.

2. *පළපුරුද්ද :*
   - (i) ඉංග්‍රීසි ලඝුලේඛනය පිළිබඳ සහතිකයක් ලබා තිබීම,
   - (ii) පරිගණක වදන් සැකසුම් පිළිබඳ සහතිකයක් ලබා තිබීම,
   - (iii) රජයේ හෝ පෞද්ගලික ආයතනයක ඉංග්‍රීසි ලඝුලේඛකයකු වශයෙන් සේවය කර තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

3. *වයස :*

අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.

4. *වැටුප :*
   - (i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව අදළ තනතුරට හිමි දෛනික වැටුප.
   - (ii) රජයේ අනුමත ජීවන වියදම් දීමනාව රු. 260.
   - (iii) ඊට අමතරව ආයතනයේ අනෙකුත් සේවකයන් සඳහා ගෙවනු ලබන දීමනාවලට සාපේක්ෂව තනතුරට අදළ දීමනාව.

දැනට රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබා ඇති නිලධාරීන්ට ද ඉල්ලුම් කළ හැකිය. (මේ සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 9/2007 අනුව ගෙවීම් කරනු ලැබේ.)

ඉල්ලුම්පත් ලේකම්, පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය , අංක 35, සිල්වා පටුමග, රාජගිරිය යන ලිපිනයට 2017.06.30 හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. තනතුරු නාමය ලියුම්කවරයේ ඉහළ වම් කෙළවරේ සටහන් කළ යුතු ය. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

ලේකම්,
පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

අංක 35, සිල්වා පටුමග,
රාජගිරිය.

06-125

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය

**පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2017 සැප්තැම්බර්**

**Limited Competitive Examination for Recruitment to Assistant Commissioner (Departmental) of Department Probation and Child Care Services - September 2017**

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(මෙම අයදුම්පත් එවීමේ දී 2015.10.23 දින රජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමට අනුව අයදුම්පත් එවන ලද අපේක්ෂකයින් ද මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලබයි.)

1. බඳවා ගැනීමේ ක්‍රමය :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව ලිඛිත විභාගයේ දී හා සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගත් මුළු ලකුණුවල එකතුව මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සුදුසු අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ.

මෙම පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

2. අවශ්‍ය සුදුසුකම් :

(i) *අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්* :

* පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් හිමි I පන්තියේ වසර 5 ක් හෝ ඊට වැඩි සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් ඇති ක්ෂේත්‍රගත/කාර්යාලගත බණ්ඩ 2 සේවා ගණයේ (MN 05-2006A) තනතුරු දරන පරිවාස නිලධාරීන් ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් සඳහා මෙම තනතුරට ඉල්ලුම් කළ හැකිය.

* පූර්වාසන්න පසුගිය පස් අවුරුදු කාලය තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

(ii) *කායික සුදුසුකම්* :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(iii) *වෙනත් සුදුසුකම්* :

* ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
* අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
* අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(iv) *වයස් සීමාව* :
දැනට රාජ්‍ය සේවයේ නියුතු වූවන් සඳහා වන බැවින් වයස් සීමාව අදාළ නොවේ.

3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) පත්වීම එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් ය. සහකාර කොමසාරිස් III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05 ක් ඇතුළත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව අදාළ පරිදි ලබා ගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

4. වැටුප් පරිමාණය :

මෙම තනතුරට රු. 47,615 - 10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 - රු. 110,895 මාසික වැටුප් පරිමාණයක් හිමිය.

(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි 07.1 ඡේදයට අනුව වැටුප් ව්‍යුහය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන 2020.01.01 වැනි දින දක්වා සිදු කරනු ලබන බඳවා ගැනීම්/උසස් කිරීම්වල දී නිකුත් කරනු ලබන පත්වීම් ලිපිවල වැටුප් පරිමාණය සඳහන් කිරීමේ දී උපලේඛන I හි සඳහන් නියමිත

වැටුප් පරිමාණය අදාළ කර ගත යුතු ය. එහෙත් ගෙවීම් සිදු කළ යුත්තේ උපලේඛන II හි සඳහන් පරිදි වේ.)

5. ලිඛිත පරීක්ෂණය :

i. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් 2017 සැප්තැම්බර් මස කොළඹ දී පවත්වනු ලැබේ.
ii. විභාගය සිංහල දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පැවැත්වේ.
iii. අයදුම්කරුවෙකුට ඉහත දක්වා ඇති භාෂාවලින් එකකින් විභායට පෙනී සිටිය හැක. එසේ වුව ද ඔහු/ඇය තමන් තෝරා ගත් එක් භාෂාවකින් පමණක් සියළුම විෂයයන්ට පෙනී සිටිය යුතු ය. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.
iv. ලිඛිත විභාගය පහත සඳහන් විෂයයන් පිළිබඳ ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

| විෂය අංකය | විෂයය | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | විෂයානුබද්ධ අධ්‍යයනය | පැය 1 1/2 | 100 | 40% |
| 02 | බුද්ධි පරීක්ෂණය | පැය 1 | 100 | 40% |

*ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය :*

(අ) *විෂයානුබද්ධ අධ්‍යයනය :*

පරිවාස ක්ෂේත්‍රයට අදාළ ආඥපනත් වන ළමා සුභ සාධනය හා සංවර්ධනය, ළමා රැකවරණය, ළමා වරදකරුවන් පුනරුත්ථාපනය, ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනත, වරදකරුවන් පරිවාස භාරයේ තැබීමේ ආඥ පනත, අනාථ ළමා නිවාස ආඥාපනත, ළමයින් දරුකමට හදා වඩා ගැනීමේ ආඥාපනත, දඬ මුදල් ගෙවීමේ ආඥා පනත, අයාල ආඥපනත තරුණ වරදකරුවන් අභ්‍යාස විද්‍යාල ආඥාපනත හා සම්බන්ධ ප්‍රායෝගික ප්‍රශ්න පත්‍රයකි.

(ආ) *බුද්ධි පරීක්ෂණය* :

අයදුම්කරුගේ නිර්මාණාත්මක චින්තක ශක්තිය, ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව හා විශ්ලේෂණාත්මක හැකියාව මැන බැලීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයිමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වන අතර, ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

6. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ ලිඛිත පරීක්ෂණයේ දී එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා අවම වශයෙන් 40% ක් හෝ ඊට වැඩි ලකුණු ලබා ගත් අයදුම්කරුවන් පමණි. එහෙත් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව මෙන් පස් ගුණයකට නොවැඩි වනු ඇත.

සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු 100 ක් හිමි වේ. කිසිම හේතුවක් නිසාවත් අවම ලකුණු සංඛ්‍යාව අඩු කරනු නොලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සම්මුඛ පරීක්ෂණය පවත්වන අතර සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙන ආකාරය පහත පරිදි වේ : —

| | *විෂයය* | *උපරිම ලකුණු* |
|---|---|---|
| 01. | අමතර අධ්‍යාපන සුදුසුකම් | 20 |
| 02. | ක්ෂේත්‍රයට අදාළව ලබාගෙන ඇති වෘත්තීය සුදුසුකම් | 25 |
| 03. | සේවා පළපුරුද්ද | 40 |
| 04. | භාෂා ප්‍රවීණතාවය | 10 |
| 05. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව | 05 |
| | **මුළු එකතුව** | **100** |

7. අයදුම්කරන ආකාරය :

I. අයදුම්පත්‍ර, ආදර්ශ ආකෘතියට අනුව A4 පත්‍රයක සකස් කොට ඉදිරිපත් කළ යුතු ය. A4 පත්‍රයේ දෙපසම පාවිච්චි කළ යුතු අතර, අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 07 දක්වා පළමු පිටුවට ද, ඉතිරිය පිළිවෙළින් අනෙකුත් පිටුවලට ද, ඇතුළත් වන සේ අයදුම්පත සකස් කළ යුතු ය. අයදුම්පත අපේක්ෂකයාගේ අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතු ය. අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල අයදුම්පත්‍රවල සිංහලවලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළවලට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය.

ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර සහ අසම්පූර්ණ තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඔබ විසි ඉදිරිපත් කරන අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

II. අපේක්ෂකයා/අපේක්ෂිකාව විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන් අයදුම්පත පිළියෙල විය යුතු ය.

III. සම්පූර්ණ කරන ලද අයදුම්පත කොළඹ, තැ. පෙ. 1503 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, විභාග කොමසාරිස් ජනරාල් වෙත 2017.06.30 වැනි දා හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි ලියාපදිංචි තැපැලෙන් යැවිය යුතු ය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''පරිවාස

හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2017'' යනුවෙන් පැහැදිලිව සලකුණු කර තිබිය යුතු ය.

IV. සෑම අතින්ම සම්පූර්ණ නොවූ අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත. තැපෑලේ දී යම් අයදුම්පතක් නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ ඉදිරිපත් කෙරෙන පැමිණිලි සළකා බලනු නොලැබේ.

V. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගත වූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින් ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදනමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

vi. අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයකු, සාමදාන විනිශ්චයකරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු රු. 292,080 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

8. විභාගයට ප්‍රවේශය :

I. විභාගයට පෙනී සිටින අයදුම්කරුවකු අත්සන සහතික කරවාගත් තම ප්‍රවේශ පත්‍රය විභාගය පැවැත්වෙන දිනට විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයකුට/අපේක්ෂිකාවකට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට/ඇයට සිදුවනු ඇත.

II. අයදුම්කරුවකු විභාගයට පෙනී සිටිය යුත්තේ ඔහුට/ඇයට නියම කරන ලද විභාග ශාලාවේ දී ය. සියලුම අයදුම්කරුවන් විසින් පිළිපැදිය යුතු නීති මාලාවක් මේ *ගැසට්* පත්‍රයේ පළවේ.

*සටහන* :
අපේක්ෂකයකුට ප්‍රවේශපත්‍රයක් නිකුත් කළ පමණින් ඔහු/ඇය *ගැසට්* නිවේදනයෙන් අපේක්ෂිත සුදුසුකම් සපුරා ඇති බවක් හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවක් නොහැඟේ.

9. විභාග ප්‍රතිඵල :

ලිඛිත හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණවල මුළු ලකුණුවල ප්‍රමුඛතාව මත සකස් කළ ප්‍රතිඵල ලේඛන ලේකම් රාජ්‍ය සේවා කොමිෂම වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.reults.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

10. විභාග ගාස්තුව රු.1,200 ක් වේ. මෙම මුදල අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරු ගේ නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතු ය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ.

*සටහන* :
කවර හේතුවක් නිසා වුව ද විභාගයෙන් ඉවත් වන හෝ නොපැමිණ සිටින හෝ, විභාගයට පෙනී සිටීමෙන් පසු සුදුසුකම් නැත්තෙකු බවට දක්නට ලැබෙන හෝ යම් අපේක්ෂකයෙකුට විභාග ගාස්තුව මුළුමනින්ම හෝ ඉන් කොටසක් හෝ ආපසු ලබා ගැනීමට හෝ වෙනත් විභාගයකට මාරු කිරීමට හිමිකමක් නැත.

11. *අයදුම්කරුගේ අනන්‍යතාව* :
අයදුම්කරු තමන් පෙනී සිටින එක් එක් විෂයයක් පාසා විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ඔහුගේ/ඇයගේ

අනන්‍යතාව ඔප්පු කළ යුතු වේ. මේ සඳහා මතු සඳහන් ලියවිලිවලින් කවරක් හෝ පිළිගනු ලැබේ:

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

12. සාවද්‍ය තොරතුරු සැපයීම :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

13. පුරප්පාඩු පිරවීම් හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

14. මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි වන්නේය. එමෙන්ම පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

15. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

චන්ද්‍රානි සේනාරත්න,
ලේකම්,
කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය.

05 වන මහල, සෙත්සිරිපාය දෙවන අදියර,
බත්තරමුල්ල.
2017 අප්‍රේල් මස 28 වැනි දින.

ඉල්ලුම් පත්‍රය

*පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව*
**සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා සීමිත බඳවා ගැනීම - 2017 සැප්තැම්බර්**

Limited Competitive Examination for Recruitment to Assistant Commissioner (Departmental) of Department Probation and Child Care Services - September 2017

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) (කාර්යාලයීය ප්‍රයෝජනය පිණිසයි)

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(*උදා.* : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDENA)
(ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(*උදා.* : GUNAWARDHANA, H. M. S. K.)
(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. දැනට සිටින සේවා ස්ථානය සහ ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ)

03. ස්ත්‍රී/පුරුෂ භාවය: ☐ 0- පුරුෂ 1- ස්ත්‍රී (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

05. දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

06. (i) ඔබ දැනට අයත් වන සේවය/ශ්‍රේණිය සහ ඊට ඇතුළත් වූ දිනය :————.
(ii) I වන ශ්‍රේණියේ සේවා කාලය :————.

07. 2017.06.30 දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළ සියළුම වැටුප් වැඩිවීම් ඔබ උපයාගෙන තිබේ ද ? උපයා නොගත් වැටුප් වර්ධක වේ නම් එසේ වීමට හේතු දක්වන්න. :————.

08. ඉකුත් අවුරුදු 05 තුළ ඔබට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කරනු ලැබ ඇත් ද? එසේ නම් වරදේ සහ පනවන ලද දඬුවමේ ස්වභාවය සහ දඬුවම් කළ දිනය ආදියේ විස්තර දක්වන්න :————.

09. *විභාග ගාස්තු* :
  (i) ලදුපත් අංකය :————.
  (ii) දිනය :————.
  (iii) මුදල් ගෙවූ කාර්යාලය :————.
  (iv) ගෙවන ලද මුදල :————.

| |
|---|
| මුදල් කුවිතාන්සිය නොගැලවෙන ලෙස එහි එක් දාරයකින් අයදුම්පත්‍රයට අලවන්න. (කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න) |

10. *අයදුම්කරුගේ සහතිකය* :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම සහ විශ්වාසය පරිදි සත්‍ය බව ප්‍රකාශ කරමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි. විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පිළිබඳව පනවනු ලබන නීතිරීතිවලට එකඟව ක්‍රියා කිරීමටත් මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථා අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන්පසු හෝ මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම ගැනත් මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11. *අධීක්ෂණ නිලධාරියාගේ සහතිකය* :

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන............................................... මයා./මිය./මෙනවිය මා ඉදිරිපිට දී මෙම ඉල්ලුම් පත්‍රය අත්සන් කළ බවත් නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
අධීක්ෂණ නිලධාරියාගේ අත්සන.

නම :————.
පදවිය :————.
ස්ථානය :————.
දිනය :————.

12. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය* :

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන............................................... මයා./මිය./මෙනවිය විසින් සඳහන් කර ඇති තොරතුරු මෙහි ඇති සේවා වාර්තා අනුව නිවැරදි බව ද, අදාළ *ගැසට්* නිවේදනයේ සඳහන් රෙගුලාසි ප්‍රකාර ඔහු/ඇය මෙම විභාගය සඳහා සිටීමට යෝග්‍යතාව ලබා ඇති බව ද ඔහු/ඇය නියමිත විභාග ගාස්තු ගෙවා ඇති අතර, එම ලදුපත අලවා ඇති බව ද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහාතෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කිරීමට හැකි බව ද මෙයින් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :————.
පදවිය :————.
ස්ථානය :————.
දිනය :————.

අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයට පසුව විභාගයට අයදුම්කරන අයදුම්කරුවන් හට පෙනී සිටීමට හෝ දක්වා ඇති භාෂා මාධ්‍යයේ වෙනසක් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

06-24

---

**කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය**

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරි
තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017 සැප්තැම්බර්

## Competitive Examination for Recruitment to Probation Officer Department of Probation and Child Care Services - September 2017

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරි තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. බඳවා ගැනීමේ ක්‍රමය :
නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් ලිඛිත විභාගයේ විෂයයන් දෙකම සමත් ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් අතුරින් දක්වන කුසලතාව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් විසින් සුදුසු අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ.
මෙම පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

2. අවශ්‍ය සුදුසුකම් :

I. *අධ්‍යාපන සුදුසුකම්* :
සමාජ විද්‍යාව/මනෝ විද්‍යාව/අපරාධ විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් හෝ කිහිපයක් හෝ ඇතුළත්ව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

II. *වෘත්තීය සුදුසුකම්* :
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා සමාජ සංවර්ධන ආයතනයේ හෝ උපදේශනය හෝ මානව හිමිකම් පිළිබඳ මාස 06කට නොඅඩු ඩිප්ලෝමාවක් හදාරා තිබීම.

III. *කායික සුදුසුකම්* :
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

IV. *වෙනත්* :
- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
- අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

V. *වයස් සීමාව* :
අවු. 21- 35 අතර විය යුතුය.
(“ඒ අනුව 1999.01.31 දිනට හෝ ඊට පෙර හා 1982.01.31 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.”)

3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :
   I. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/ පුරුෂ අනත් දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දයක මුදල් ගෙවිය යුතුය.
   II. මෙම තනතුර තුන් අවුරුදු (03) පරිවාස කාලයකට යටත් වේ. පරිවාස නිළධාරී තනතුරට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.
   III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව අදළ පරිදි ලබාගත යුතුය.
   IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසි වලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වලටද, මෙම පත්වීම යටත් වේ.

4. වැටුප් පරිමාණය :

මෙම තනතුරට රු. 34,605/-10 x 660-11 x 755-15 x 930- රු. 63,460/- මාසික වැටුප් පරිමාණයක් හිමිය.

(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි 07.1 ජේදයට අනුව වැටුප් ව්‍යුහය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන 2020.01.01 දින දක්වා සිදු කරනු ලබන බඳවා ගැනීම්/උසස් කිරීම්වලදී නිකුත් කරනු ලබන පත්වීම් ලිපිවල වැටුප් පරිමාණය සඳහන් කිරීමේදී උපලේඛන I හි සඳහන් නියමිත වැටුප් පරිමාණය අදල කර ගත යුතුය. එහෙත් ගෙවීම් සිදු කළ යුත්තේ උපලේඛණ II හි සඳහන් පරිදි වේ.)

5. ලිඛිත පරීක්ෂණය :
   I. පරිවාස හා ළමා රක්ෂක සේවා කොමසාරිස් වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් 2017 සැප්තැම්බර් මස කොළඹ දී පවත්වනු ලැබේ.
   II. විභාගය : සිංහල මාධ්‍යයෙන් පැවැත්වේ.
   III. ලිඛිත විභාගය පහත සඳහන් විෂයයන් පිළිබඳ ප්‍රශ්න පත්‍ර වලින් සමන්විත වේ.

| *විෂය අංකය* | *විෂයය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01 | සමාජ සංවර්ධන සමාජ වැඩ හා ළමාරක්ෂක සේවා (ශ්‍රී ලංකාවට අදළ) | පැය 1 1/2 | 100 | 40% |
| 02 | සිද්ධි අධ්‍යයනය | පැය 1 1/2 | 100 | 40% |

ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය :

(අ) සමාජ සංවර්ධනය, සමාජ වැඩ හා ළමාරක්ෂණය (ශ්‍රී ලංකාවට අදළව) :

රටක සංවර්ධන ක්‍රියාවලිය සඳහා ළමා පරපුරට අදළ වන ගැටලු සෘජුව බලපාන ආකාරය හා ඒ සඳහා වන විසඳුම් හා යෝජනා හඳුනා ගැනීම, සමාජ වැඩකරුවෙකුගේ කාර්ය භාරය හා ළමුන් සමග කටයුතු කිරීමේදී " සමාජ වැඩ" පිළිබඳ විෂයෙහි ඇති න්‍යායාත්මක පසුබිම ප්‍රායෝගිකව යොදා ගන්නා අයුරු, ජාත්‍යන්තර වශයෙන් ළමා අයිතිවාසිකම් සම්මුතිය හා ළමාරක්ෂණයේ නව ප්‍රවණතා හඳුනා ගැනීම හා ශ්‍රී ලාංකික සමාජ සංස්කෘතික පසුබිම තුළ එකී ප්‍රවණතා භාවිතා කළ හැකි ආකාරය.

(ආ) සිද්ධි අධ්‍යයනය :
ළමුන් සම්බන්ධ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් දෙනු ලබන සිද්ධියක් හෝ සිද්ධීන් කිහිපයක් අධ්‍යයනය කොට න්‍යායාත්මක දනුම ඇසුරුකොට ගෙන ශ්‍රී ලාංකික සමාජ, ආර්ථික, සංස්කෘතික හා නෛතික පසුබිම ආශ්‍රයෙන් එකී සිද්ධීන් සඳහා සාර්ථක ප්‍රායෝගික විසඳුම් යෝජනා කිරීම් සම්බන්ධ ප්‍රශ්න පත්‍රයකි.

6. අයදුම්කරන ආකාරය :

අයදුම්පත්‍ර, ආදර්ශ ආකෘතියට අනුව A4 පත්‍රයක සකස් කොට ඉදිරිපත් කළ යුතුය. A4 පත්‍රයේ දෙපසම පාවිච්චි කළ යුතු අතර අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 06 දක්වා පළමු පිටුවට ද, ඉතිරිය පිළිවෙළින් අනෙකුත් පිටු වලට ද ඇතුළත් වන සේ අයදුම්පත සකස් කළ යුතුය. අයදුම්පත අපේක්ෂකයාගේ අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය.

අයදුම්පත්‍රය පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල අයදුම්පත්‍රවල සිංහලවලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළ වලට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර සහ අසම්පූර්ණ තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඔබ විසින් ඉදිරිපත් කරන අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

I. අපේක්ෂකයා/ අපේක්ෂිකාව විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන් අයදුම්පත පිළියෙල විය යුතුය.

II. සම්පූර්ණ කරන ලද අයදුම්පත කොළඹ, තැ. පෙ.1503 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, විභාග කොමසාරිස් ජනරාල් වෙත 2017 ජූලි මස 30 වැනි ද හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ " පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිළධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය- 2017 සැප්තැම්බර් " යනුවෙන් පැහැදිලිව සලකුණු කර තිබිය යුතුය.

III. සෑම අතින්ම සම්පූර්ණ නොවූ අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත. තැපෑලේදී යම් අයදුම්පතක් නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ ඉදිරිපත් කෙරෙන පැමිණිලි සළකා බලනු නොලැබේ.

IV. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින් ම විමසා සිටීම වඩාත් ඵලදයී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදනමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

V. අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරු ගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවාද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු, කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස් වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස් වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු රු.240,360/- ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

7. විභාගයට ප්‍රවේශය :

I. විභාගයට පෙනී සිටින අයදුම්කරුවකු අත්සන සහතික කරවාගත් තම ප්‍රවේශ පත්‍රය විභාගය පැවැත්වෙන දිනට විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය විභාගය පැවැත්වෙන දිනට ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයකුට/ අපේක්ෂිකාවකට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට/ඇයට සිදුවනු ඇත.

II. අයදුම්කරුවකු විභාගයට පෙනී සිටිය යුත්තේ ඔහුට/ඇයට නියම කරන ලද විභාග ශාලාවේ දීය. සියලුම අයදුම්කරුවන් විසින් පිළිපැදිය යුතු නීති මාලාවක් මේ *ගැසට්* පත්‍රයේ පළවේ.

සටහන :
අපේක්ෂකයකුට ප්‍රවේශපත්‍රයක් නිකුත් කළ පමණින් ඔහු/ඇය *ගැසට්* නිවේදනයෙන් අපේක්ෂිත සුදුසුකම් සපුරා ඇති බවක් හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවක් නොහැඟේ.

8. විභාග ප්‍රතිඵල :
ලිඛිත පරීක්ෂණයේ මුළු ලකුණුවල ප්‍රමුඛතාව මත සකස් කළ ප්‍රතිඵල ලේඛන පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

9. විභාග ගාස්තුව රු.1000 ක් වේ. මෙම මුදල අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දරයක් මඟින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ.

*සටහන:*
කවර හේතුවක් නිසා වුව ද විභාගයෙන් ඉවත් වන හෝ නොපැමිණ සිටින හෝ, විභාගයට පෙනී සිටීමෙන් පසු සුදුසුකම් නැත්තෙකු බවට දක්නට ලැබෙන හෝ යම් අපේක්ෂකයෙකුට විභාග ගාස්තුව මුළුමනින්ම හෝ ඉන් කොටසක් හෝ ආපසු ලබා ගැනීමට හෝ වෙනත් විභාගයකට මාරු කිරීමට හිමිකමක් නැත.

10. අයදුම්කරුගේ අනන්‍යතාව
අයදුම්කරු තමන් පෙනී සිටින එක් එක් විෂයයක් පාසා විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ඔහුගේ/ ඇයගේ අනන්‍යතාව ඔප්පු කළ යුතුවේ. මේ සඳහා මතු සඳහන් ලියවිලි වලින් කවරක් හෝ පිළිගනු ලැබේ.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

II. වලංගු විදේශ ගමන් බලපත්‍රය

11. සාවද්‍ය තොරතුරු සැපයීම :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

12. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් සතුවේ.

13. මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි වන්නේය. එමෙන්ම පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම හෝ පුරප්පාඩු වලින් කොටසක් පිරවීම පිළිබඳව අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

14. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භෂා පාඨය බල පැවැත්වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

චන්ද්‍රානි සේනාරත්න,
ලේකම්,
කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය.

2017 මැයි මස 08 වැනි දින,
5 වන මහළ, සෙත්සිරිපාය 11 වන අදියර
බත්තරමුල්ල.

**ඉල්ලුම් පත්‍රය**

පරිවාස හා ළමාරක්ෂණ සේවා දෙපාර්තමේන්තුවේ
පරිවාස නිලධාරී තනතුර සඳහා විවෘත බඳවා ගැනීම -2017 සැප්තැම්බර්
Open Competitive Examination for Recruitmet To Probation Officer (Department )
of Department Probation and Child Care Services - September 2017

(කාර්යාලීය ප්‍රයෝජනය පිණිසයි)

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රිසි කැපිටල් අකුරෙන්) :————.
උදා ඃ (HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDENA)
(ii) අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම් වල මුලකුරු පසුවද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින් ) ඃ
උදා ඃ GUNAWARDHANA, H.M.S.K
(iii) සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) :————.

02. ස්ථිර ලිපිනයඃ (ඉංග්‍රිසි කැපිටල් අකුරෙන්) :————.
(ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)
දැනට පදිංචි ලිපිනය :————.

03. ස්ත්‍රී / පුරුෂ භාවය : ☐ 0 - පුරුෂ, 1 - ස්ත්‍රී (අදාළ අංකය කොටුව තුළ ලියන්න )

04. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

05. දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

06. (i) උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස ඃ

අවු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

07. විභාග ගාස්තු :
(i) ලදුපත් අංකය :————.
(ii) දිනය :————.
(iii) මුදල් ගෙවූ කාර්යාලය :————.
(iv) ගෙවන ලද මුදල :————.

මුදල් කුවිතාන්සිය නොගැලවෙන ලෙස එහි එක් දාරයකින් අයදුම්පතට අලවන්න

(කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න. )

08. අයදුම්කරුගේ සහතිකය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය බව ප්‍රකාශ කරමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි. විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පිළිබඳව පනවනු ලබන නීතිරීති වලට එකඟව ක්‍රියා කිරීමට මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථා අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසු හෝ මගේ විභාග අපේක්ෂකත්වය අවංගු කිරීම ගැනත් මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

09. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ඃ

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන .......................................මයා / මිය / මෙනවිය විසින් සඳහන් කර ඇති තොරතුරු මෙහි ඇති සේවා වාර්තා අනුව නිවැරදි බව ද, අදාළ *ගැසට්* නිවේදනයේ සඳහන් රෙගුලාසි ප්‍රකාර ඔහු/ ඇය මෙම විභාගය සඳහා පෙනී සිටීමට යෝග්‍යතාව ලබා ඇති බව ද ඔහු/ ඇය නියමිත විභාග ගාස්තු ගෙවා ඇති අතර, එම ලදුපත අලවා ඇති බව ද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කිරීමට හැකි බව ද මෙයින් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

(නිල මුද්‍රාව)

නම ඃ————.
පදවිය ඃ————.
ස්ථානය ඃ————.
දිනය ඃ————.

10. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව, ඔහු / ඇය මා ඉදිරිපිට දී ........................ දින ඔහුගේ /ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද, සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

06-25

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත්වීම සඳහා පැවැත්වෙන තරග විභාගය - 2017
### කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව - 2018/2020

කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව - 2018/2020 සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීමේ තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් සිංහල හා දෙමළ මාධ්‍යවලින් 2017 ඔක්තෝබර් මස තුළ ප්‍රධාන නගර කිහිපයක පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයන්හි පවත්වනු ලැබේ.

02. **කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව :**

2.1 කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලයන්හි ''කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය'' පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව පවත්වා ගෙන යනු ලැබේ. මෙම පාඨමාලාව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි කර ඇති අතර, ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 6 මට්ටම ලබාදේ.

2.2 මෙම පාඨමාලාව ගැහැණු පිරිමි දෙපක්ෂයටම විවෘත වන අතර, මෙම විභාගයෙන් සුදුසුකම් ලැබූ අය සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව කුසලතා හා දිස්ත්‍රික් පදනම මත අඟුණකොළපැලැස්ස, කරපිංච, කුණ්ඩසාලේ, පැල්වෙහෙර සහ වව්නියාව යන කෘෂිකර්ම විද්‍යාල පහට තෝරා ගනු ලැබේ.

2.3 සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙනුයේ සුදුසුකම් ලැබූ අයගේ සුදුසුකම්වල නිරවද්‍යතාව පරීක්ෂා කිරීම සඳහා පමණි.

2.4 මෙම පාඨමාලාව පූර්ණ ලෙස ඉංග්‍රීසි මාධයෙන් පවත්වනු ලැබේ.

2.5 මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමට කෘෂිකර්ම විද්‍යාලයේ අවුරුදු දෙකක පුහුණුවෙන් පසු ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරියේ (NAITA) අධීක්ෂණය යටතේ මාස 06ක රැකියාස්ථ පුහුණුවක් නම් කරන ලද ආයතනයකින් ලබා ගැනීම අනිවාර්යය වේ.

2.6 කෘෂිකර්ම විද්‍යාලයේ පාඨමාලා පැවැත්වෙන කාලය තුළ නේවාසිකව සිටීම අනිවාර්යය වේ.

03. පාඨමාලා සඳහා ඇතුළත් වීමට තිබිය යුතු සුදුසුකම් :

3.1 (*අ*) සිංහල/දෙමළ, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් තුනට අනිවාර්යයෙන් සම්මාන සාමාර්ථ හෝ විශිෂ්ට සාමාර්ථ ද, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය හෝ ඉතිහාසය හෝ ජීවන නිපුනතා හා පුරවැසි අධ්‍යාපනය හෝ කෘෂි ආහාර තාක්‍ෂණය හෝ උද්‍යාන විද්‍යාව යන විෂයයන් හයෙන් (06) එකකටවත් සම්මාන සාමාර්ථයක් ඇතිව (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන සාමාර්ථ හතරක් (04) තිබිය යුතුය.) දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06ක් සහිතව අ. පො. ස. (සා. පෙළ) සමත් වී තිබිය යුතුය. මෙහිදී එක් වරකදී විෂයයන් තුනකට (03) සම්මාන සමාර්ථ සහිතව අවම වශයෙන් විෂයයන් 5ක් සමත්වී තිබීම.

*සහ*

අ. පො. ස. (උසස් පෙළ) විභාගයේදී ජීව විද්‍යා විෂය ධාරාව තුළ ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් තුන හදරා එක් විෂයයක්වත් සමත් වී තිබීම (කෘෂිකර්ම විද්‍යාලවට තෝරා ගැනීමේදී දිස්ත්‍රික් මට්ටමේදී විෂයයන් තුනක් (03) සමත්වී ඇති සිසුන්ට ප්‍රමුඛතාවක් ලබා දෙනු ලැබේ.) ;

*හෝ*

අ. පො. ස. (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යා විෂය ධාරාව තුළ ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව හා රසායන විද්‍යාව යන විෂයයන් තුන හදරා එක් විෂයයක්වත් සමත් වී තිබීම. (කෘෂිකර්ම විද්‍යාලවලට තෝරා ගැනීමේදී දිස්ත්‍රික් මට්ටමේදී විෂයයන් තුනක් (03) සමත් වී ඇති සිසුන්ට ප්‍රමුඛතාවක් ලබා දෙනු ලැබේ.)

(උසස් පෙළ සඳහා ගණිතය විෂය ධාරාව හැදෑරූ සිසුන් රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව සමත් වී තිබීම මෙම පාඨමාලාවට සුදුසුකම් ලැබුවා සේ නොසැළකේ.)

*(ආ)* සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් තුනට අනිවාර්යයෙන් සම්මාන සාමාර්ථ හෝ විශිෂ්ට සාමාර්ථ ද, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය හෝ ඉතිහාසය හෝ ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය හෝ කෘෂි ආහාර තාක්‍ෂණය හෝ උද්‍යාන විද්‍යාව යන විෂයයන් හයෙන් (06) අවම වශයෙන් එකකටවත් සම්මාන සාමාර්ථයක් ද ඇතිව (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන සාමාර්ථ හතරක් (04) තිබිය යුතුය) දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයක් (06) සහිතව අ. පො. ස. (සා. පෙළ) සමත් වී තිබිය යුතුය. මෙහිදී එක් වරකදී විෂයන් තුනකට (03) සම්මාන සාමාර්ථ සහිතව අවම වශයෙන් විෂයයන් පහක් (05) සමත් වී තිබීම.

*සහ*

අ. පො. ස. (උසස් පෙළ) විභාගයේදී තාක්ෂණ වේදය විෂය ධාරාවේ ජෛව තාක්ෂණ වේදය, තාක්ෂණ වේදය සඳහා විද්‍යාව සහ කෘෂිකර්මය යන විෂයයන් තුන හදරා එක් විෂයයක්වත් සමත් වී තිබීම, (කෘෂිකර්ම විද්‍යාලවලට තෝරා ගැනීමේදී දිස්ත්‍රික් මට්ටමේදී විෂයයන් තුනක් සමත් වී ඇති සිසුන්ට ප්‍රමුඛතාවක් ලබා දෙනු ලැබේ.)

*හෝ*

අ. පො. ස. (උසස් පෙළ) විභාගයේදී තාක්ෂණ වේදය විෂය ධාරාවේ ඉංජිනේරු තාක්ෂණ වේදය, තාක්ෂණ වේදය සඳහා විද්‍යාව හා කෘෂිකර්මය යන විෂයයන් තුන හදරා එක් විෂයයක්වත් සමත් වී තිබීම. (කෘෂිකර්ම විද්‍යාලවලට තෝරා ගැනීමේදී දිස්ත්‍රික් මට්ටමේදී විෂයයන් තුනක් සමත් වී ඇති සිසුන්ට ප්‍රමුඛතාවක් ලබා දෙනු ලැබේ.)

3.2 2017.06.30 වැනි දිනට අපේක්ෂකයාගේ වයස අවුරුදු 17ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 25ට වැඩි නොවිය යුතුය. (ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 2000.06.30 දින හෝ ඊට පෙර හා 1992.06.30 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි. රජයේ සේවයේ නියුතු අය මෙම තරග විභාගයට පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.)

04. පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීම :

4.1 මෙම දැන්වීම අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය ප්‍රකාර අයදුම්කරුවන්ගේ අත් අකුරුවලින් හෝ යතුරු ලියනය කර හෝ පරිගණක ගත කරගෙන 8"x 12" ප්‍රමාණයේ (A 4 ප්‍රමාණයේ) කඩදාසියක දෙපැත්තම භාවිතා කරමින් තම අයදුම්පත සකස් කළ යුතුය. අයදුම්පත පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍ර වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු වේ. එහි අංක 01 සිට අංක 10 තෙක් මුල් පිටුවේ ද, 11 සිට 13 තෙක් දෙවන පිටුවේ ද, ඉතිරිය 3 වැනි පිටුවේ ද සඳහන් කළ යුතු වේ. අසම්පූර්ණව පුරවා ඇති හා ආදර්ශ ආකෘතිය අනුව සකස් නොකළ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තමන් සම්පූර්ණ කරනු ලබන අයදුම් පත්‍රය මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු/කාරිය විසින් වග බලාගත යුතු වේ. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් තමන් ළඟ තබාගත යුතු වේ.

4.2 විභාග ගාස්තුව රු. 700කි. අපේක්‍ෂකයා විසින් මහජන බැංකුවේ කෘෂිකර්ම අධ්‍යක්‍ෂ ජනරාල්ගේ අංක : 057100179027204 දරන ගිණුමට විභාග ගාස්තු බැර කළ යුතුය. මුදල් බැරකර ලබාගත් කුවිතාන්සිය අයදුම්පත්‍රයේ අදාළ ස්ථානයේ අලවා එවීමට කටයුතු කළ යුතු වේ. (ගලවා ගැනීමට හැනි වනසේ) තව ද මුදල් කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීමට කටයුතු කළ යුතුය. මොනම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගයට ගෙවන ලද ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කළ නොහැක. විභාග ගාස්තු සඳහා වූ මුදල් කුවිතාන්සිය අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත.

4.3 සියලුම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් 2017.06.30 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "අධ්‍යක්‍ෂ, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය" යන ලිපිනයට එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී ප්‍රමාද වන හෝ නැතිවන හෝ අයදුම්පත් ගැන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගකීම් දරනු නොලැබේ.

4.4 අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "2018/2020 කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත් වීම" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

05. *විභාග මධ්‍යස්ථාන* :

2018/2020 කාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳව උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් ඇතුළත් කරගැනීමේ තරග විභාගය, විභාග දෙපාර්තමේන්තුව මගින් සිංහල හා දෙමළ මාධ්‍යවලින් 2017 ඔක්තෝබර් මස තුළදී පහත සඳහන් නගරවල පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පවත්වනු ලැබේ.

| නගර අංකය | නගරය |
|---|---|
| (1) | අනුරාධපුරය |
| (2) | බදුල්ල |
| (3) | මඩකලපුව |
| (4) | කොළඹ |
| (5) | ගාල්ල |
| (6) | යාපනය |
| (7) | මහනුවර |

| නගර අංකය | නගරය |
|---|---|
| (8) | කුරුණෑගල |
| (9) | මාතර |
| (10) | ත්‍රිකුණාමලය |
| (11) | වවුනියාව |
| (12) | රත්නපුරය |
| (13) | හම්බන්තොට |
| (14) | කිලිනොච්චිය |

කිසියම් විභාග මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් විභාග අපේක්ෂකයන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති විට ඔවුන්ගේ දෙවැනි කැමැත්ත අනුව හෝ අයදුම් කොට ඇති මධ්‍යස්ථානයට සමීප වෙනත් විභාග මධ්‍යස්ථානයක් හෝ ඔවුන්ට නියම කෙරෙනු ඇත. විභාගය සඳහා ඉල්ලුම් කළ නගරය/නගර හෝ භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

06. *විභාග ක්‍රමය* ඃ

6.1 තරග විභාගය සඳහා වූ විෂයයන් හා කාල සටහන පහත සඳහන් වේ :

| | විෂයයන් | කාලය | කාල සටහන |
|---|---|---|---|
| 01 | පළමු ප්‍රශ්න පත්‍රය (01) - කෘෂිකර්මය (ලකුණු 100 යි) (අ. පො. ස. (සා. පෙළ) කෘෂිකර්ම විෂයය නිර්දේශ මට්ටම හා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පොදු විෂය කරුණු ආශ්‍රිතව සකස් කළ බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න අඩංගු වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය). | පැය 1 යි | 09.30 පැය - 10.30 පැය |
| 02. | දෙවන ප්‍රශ්න පත්‍රය (2) - බුද්ධි පරීක්ෂණය (ලකුණු 100යි) (රටා, සබඳතා, පුරෝකථන, ගැලපීම්, විශ්ලේෂණ කුසලතා පිළිබඳ හැකියා ආදිය පරීක්ෂාවට ලක් වේ. බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු වේ). | පැය 1 යි | 11.00 පැය - 12.00 පැය |

6.2 මෙහි 3.1 සහ 3.2 ඡේදයන්හි සඳහන් සුදුසුකම් ඇති සියලුම අයදුම්කරුවන්ට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ප්‍රවේශ පත්‍ර එවනු ලැබේ. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාවේ ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශපත්‍ර නොලැබුණි නම්, ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද, සඳහන් කර පහත අ, ආ, සහ ඇ හි සඳහන් ලියවිලිවල සහතික කරන ලද ඡායා පිටපත් ද සමගින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ඔබගේ ප්‍රවේශ පත්‍රය නොලැබීම පිළිබඳව දැන්වීම වඩා ඵලදායි වනු ඇත ඃ

(*අ*) අයදුම්පත්‍රයේ ඡායා පිටපතක්,
(*ආ*) විභාගය සඳහා මුදල් ගෙවූ මුදල් කුවිතාන්සියේ ඡායා පිටපතක්,
(*ඇ*) අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සියේ ඡායා පිටපතක්.

6.3 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සිසුන් ලබා ගත් ලකුණු ඔවුන්ගේ ලිපිනයන්ට දන්වා එවනු ඇත. දිස්ත්‍රික් මට්ටමෙන් ඉහත විෂයයන් දෙකේ එකතුවෙහි වැඩිම ලකුණු ලබාගත් සිසුන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. මෙම ලිඛිත විභාගයට පෙනී සිටීමට ඉඩදීම මත හෝ සම්මුඛ පරීක්‍ෂණයට පෙනී සිටීමට කැඳවීම මත හෝ අදාළ අපේක්‍ෂකයාගේ සුදුසුකම් පිළිගැනීමක් නොවන බව සැළකිය යුතුය. විභාගයට පෙර හෝ එය පවත්වන අතර හෝ ඉන්පසුව හෝ යන කවර අවස්ථාවක දී වුවත් මෙම නිවේදනයේ කරුණු අනුව නුසුදුසු යැයි තීරණය වන අයදුම්කරුවකුගේ විභාගාපේක්‍ෂකත්වය අවලංගු කරනු ලැබේ.

6.4 ලිඛිත විභාගයට හෝ සම්මුඛ පරීක්‍ෂණයට හෝ ඒ දෙකටම හෝ පෙනී සිටීම වෙනුවෙන් රජය විසින් අපේක්‍ෂකයින්ට කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

07. බඳවා ගැනීමේ ක්‍රමවේදය :

7.1 බඳවා ගන්නා වර්ෂය තුළදී සියලුම කෘෂිකර්ම විද්‍යාලවලට බඳවා ගන්නා මුළු සංඛ්‍යාව පදනම් කර ගෙන අයදුම්කරුවන් සිටින දිස්ත්‍රික්කවලට ඇතුළත් කරගනු ලබන සංඛ්‍යාව තීරණය කරගනු ලැබේ. ඉන්පසුව දිස්ත්‍රික්කයට අයත් අයදුම්කරුවන් අතරින් තරග විභාගයේ පළමු හා දෙවන විෂයයන් දෙකේ ලකුණු එකතුව අනුව වැඩිම කුසලතාව පෙන්නුම් කළ අයදුම්කරුවන් හෝ අයදුම්කාරියන් තෝරාගනු ලැබේ. එසේ තේරීමේදී පහත සඳහන් කරුණු ද සැළකිල්ලට ගනු ලැබේ.

7.2 දිස්ත්‍රික් පදනම සළකා බැලීමේදී අ. පො. ස. (සා. පෙළ) විභාගයට පළමුවන වරට පෙනී සිටි දිස්ත්‍රික්කය අයදුම්කරු හෝ අයදුම්කාරිය අයත් දිස්ත්‍රික්කය ලෙස සළකනු ලැබේ. අ. පො. ස. (සා. පෙළ) විභාගයට පළමුවනවරට පෙනී සිටි දිස්ත්‍රික්කයට අදල අංකය සොයා අයදුම්පතේ අංක 5 පිරවීම සඳහා මෙම *ගැසට්* නිවේදනයේ අවසානයට පළකර ඇති අමුණුම් අංක 01 උපයෝගී කරගත යුතුවේ.

7.3 ලිඛිත විභාගයේ කෘෂිකර්මය හා බුද්ධි පරීක්‍ෂණය යන විෂයයන් දෙකේ ලකුණුවල එකතුව අනුව වැඩිම ලකුණු ලබා ගන්නා අපේක්‍ෂිකයින් දිස්ත්‍රික් පදනමින් තෝරා ගෙන සම්මුඛ පරීක්‍ෂණයට කැඳවනු ලැබේ. ප්‍රතිඵල ලේඛනයේ දිස්ත්‍රික් කුසලතාවය ගණය කිරීම සඳහා අයදුම්පත්‍රයේ අංක 5 යටතේ වූ තොරතුරු පදනම් කරගනු ලැබේ. එහිදී අ. පො. ස. (උ. පෙළ) ජීව විද්‍යා විෂයය ධාරාව හෝ තාක්ෂණ වේදය විෂයය ධාරාව හදරා විෂයයන් 03කින් එකවර සමත්වූ හා තරග විභාගයේ විෂයයන් දෙකේ එකතුව අනුව වැඩිම ලකුණු ලබාගෙන කුසලතාවය දක්වූ අයට ප්‍රමුඛතාවය දෙමින් ඒ අය පළමුව තෝරා ගනු ලැබේ. යම් දිස්ත්‍රික්කයකින් එවැනි අයදුම්කරුවන් නොමැති විට හෝ එවැනි අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති විටදී පමණක් එම දිස්ත්‍රික්කවලින් තෝරා ගනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව සම්පූර්ණ වනසේ අ. පො. ස. (උ.පෙළ) විෂයන් දෙකක් හෝ එකක් සමත් අයදුම්කරුවන් අතරින් තරග විභාගයේ විෂයයන් දෙක සඳහා වැඩිම ලකුණු ලබා ගෙන කුසලතාවය දක්වූ අයදුම්කරුවන් තෝරාගනු ලැබේ. මෙම තෝරා ගැනීම නිවාර්යයෙන්ම 7.1හා 7.2 හි සඳහන් ආකාරයට දිස්ත්‍රික්ක පදනමින් හා විභාගයේදී දක්වූ කුසලතාව අනුව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් අනුමත කර ඇති ක්‍රමයක් අනුව සිදු කෙරේ. අදළ වර්ෂයේදී එක් එක් කෘෂිකර්ම විද්‍යාලයට ඇතුළත් කරගනු ලබන පිරිමි හා ගැහැණු සිසුන් සංඛ්‍යාව එම විද්‍යාලවල පිරිමි හා කාන්තා නේවාසිකාගාරවල ඇති ඉඩකඩ අනුව හා එම විද්‍යාලවල ඇති පුහුණු පහසුකම් අනුව තීරණය කරනු ඇත. මේ නිසා තෝරා ගැනීමට සළකා බලන තරග විභාගයේ විෂයයන් දෙකේ ලකුණුවල එකතුවේ කඩඉම් ලකුණු මට්ටම් දිස්ත්‍රික්කයක පිරිමි හා ගැහැණු අයදුම්කරුවන් අතර වෙනස් වේ. කිසියම් දිස්ත්‍රික්කයක තෝරා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති විටදී විද්‍යාලවලට උපරිම සිසුන් ප්‍රමාණයක් ඇතුළත් කිරීම සඳහා අනිකුත් දිස්ත්‍රික්කවලින් අවශ්‍ය සිසුන් සංඛ්‍යාව තෝරාගනු ලැබේ.

7.4 ඉහත සඳහන් කරුණු සළකා බලමින් තරග විභාගයේ විෂයයන් දෙකේ ලකුණු එකතුව අනුව වැඩිම ලකුණු සංඛ්‍යාවක් ලබාගත් සිසුන් සීමිත ප්‍රමාණයක්, එක් එක් දිස්ත්‍රික්කයකින් කැඳවා ඔවුන්ගේ අධ්‍යාපනික සහතික හා අදාළ වෙනත් සහතික පරීක්‍ෂා කිරීමට සම්මුඛ පරීක්‍ෂණයක් පවත්වනු ලැබේ. අයදුම්පතේ සඳහන් සහතිකවල මුල් පිටපත් මෙහිදී පරීක්‍ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්‍ෂණයට ලකුණු ලබාදෙනු නොලැබේ. කෘෂිකර්ම විද්‍යාලවලට තෝරාගනු ලබන සිසුන් සංඛ්‍යාවට වඩා වැඩි සිසුන් ප්‍රමාණයක් සම්මුඛ පරීක්‍ෂණයට කැඳවනු ලැබේ.

08. ''කුසුමා ලක්‍ෂමී කරුණාතිලක'' සිහිවටන ශිෂ්‍යත්වය :

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේදී කෘෂිකර්මය, බුද්ධි පරීක්‍ෂණ යන ප්‍රශ්න පත්‍ර දෙකේ එකතුව අනුව වැඩිම ලකුණු ලබා ගත් අයදුම්කාරියකට ඉහත ශිෂ්‍යත්වයේ කොන්දේසිවලට යටත්ව වර්ෂ දෙකක් සඳහා මෙම ශිෂ්‍යත්වය ප්‍රදානය කරනු ලැබේ. තෝරාගත් ශිෂ්‍යත්වලාභිණියට කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ ඉගෙනුම ලැබීමට අවස්ථාව සළසා දෙනු ලැබේ. මෙම ශිෂ්‍යත්වයේ වාර්ෂික වටිනාකම රු. 10,000 ක් වේ.

ආචාර්ය ආර්. ආර්. ඒ. විජේකෝන්,
කෘෂිකර්ම අධ්‍යක්‍ෂ ජනරාල්.

2017 මැයි මස 12 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

ඇමුණුම් අංක 01

**දිස්ත්‍රික්කවල නම් හා ඒවාට අයත් අංක**
**(7.2 ඡේදයට අදාළ වේ.)**

| දිස්ත්‍රික් අංක | දිස්ත්‍රික්කය |
|---|---|
| 01 | අනුරාධපුරය |
| 02 | බදුල්ල |
| 03 | මඩකලපුව |
| 04 | කොළඹ |
| 05 | ගාල්ල |
| 06 | යාපනය |
| 07 | මහනුවර |
| 08 | කුරුණෑගල |
| 09 | මාතර |
| 10 | ත්‍රිකුණාමලය |
| 11 | වවුනියාව |
| 12 | රත්නපුරය |
| 13 | හම්බන්තොට |
| 14 | ගම්පහ |
| 15 | කළුතර |
| 16 | මාතලේ |
| 17 | නුවරඑළිය |
| 18 | මන්නාරම |
| 19 | මුලතිව් |
| 20 | අම්පාර |
| 21 | පුත්තලම |
| 22 | පොළොන්නරුව |
| 23 | මොණරාගල |
| 24 | කෑගල්ල |
| 25 | කිලිනොච්චිය |

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුලත්වීම සඳහා පැවැත්වෙන තරග විභාගය - 2017
කෘෂිකාර්මික නිෂ්පාදන තාක්‍ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව - 2018/2020
(Competitive Examination for Admission to Sri Lanka School of Agriculture - 2017
(Higher National Diploma in Agriculture Production Technology - 2018/2020

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි).

1.

| විභාගයට පෙනී සිටින නගරය : | එහි අංකය : |
|---|---|
| 1 වන තේරීම .................... | .................... |
| 2 වන තේරීම .................... | .................... |

(*ගැසට්* පත්‍රයේ මුල් ඡේදයට අනුව)

2. තරග විභාගයට පෙනී සිටීමට කැමති භාෂා මාධ්‍යය :

සිංහල මාධ්‍යය - 2
දෙමළ මාධ්‍යය - 3

.........

(අදාළ අංකය ඉදිරිපස කොටුව තුළ ලියන්න)

3. ස්ත්‍රී/පුරුෂ භාවය :

| |
|---|
| පුරුෂ - 0 |
| ස්ත්‍රී - 1 |

............

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4. සා. පෙළ විභාගයට ප්‍රථම වරට පෙනී සිටි පාසල අයත්වන දිස්ත්‍රික්කය

.............................

දිස්ත්‍රික් අංකය

............

(7.2 ඡේදයට අනුව/ඇමුණුම 01 බලන්න)

5. අ. පො. ස. (උසස් පෙළ) ජීව විද්‍යා විෂය ධාරාව/ තාක්ෂණවේදය විෂය ධාරාව හදාරා සමත් වී ඇති විෂයයන් ගණන :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

විෂයයන් තුනක් එකවර - 3
විෂයයන් දෙකක් හෝ එකක් එකවර - 2

සමත් වූ විෂයයන් ගණනට අදාළ අංකය :

.................

(3.1 ඡේදයට අනුව)

6. (අ) (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා. : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDENA)

(ii) අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොද නම (ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්) :————.
(උදා. : GUNAWARDENA H. M. S. K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

7. (i) ලිපිනය :————.

(ii) විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්) :————.

(iii) සම්බන්ධ කරගත හැකි දුරකථන අංක :

(i) ස්ථාවර : | | | | | | | | | | |

(ii) ජංගම : | | | | | | | | | | |

8. (අ) අ. පො. ස. (සා. පෙළ) විභාගයට පළමු වරට පෙනී සිටි පාසල හා ලිපිනය :————.

(ආ) පළමුවරට අ. පො. ස. (සා. පෙළ) විභාගයට පෙනී සිටි පාසල අයත් දිස්ත්‍රික්කය (සිංහලෙන්) :————.

(ඇ) පළමුවරට අ. පො. ස. (සා. පෙළ) විභාගයට පෙනී සිටි පාසල අයත් දිස්ත්‍රික්කය (ඉංග්‍රීසියෙන්) :————.

9. ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | | | | | | | |

10. (අ) පදිංචි මැතිවරණ කොට්ඨාසය (සිංහලෙන්) :————.

(ආ) මැතිවරණ කොට්ඨාසය (ඉංග්‍රීසියෙන්) :————.

11. උපන් දිනය : අවුරුද්ද : | | | | | මාසය : | | | දිනය : | | |

12. 2017.06.30 වැනි දිනට වයස : අවුරුදු : | | | මාස : | | | දින : | | |

13. අධ්‍යාපන සුදුසුකම් : (*ගැසට්* නිවේදනයේ සඳහන් විස්තර අනිවාර්යයෙන් කියවා මෙම කොටස පිරවිය යුතු වේ.)

(අ) *ගැසට්* නිවේදනයේ 3.1 ඡේදය අනුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයන් හය හෝ ඊට වැඩි ගණන :

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයයන් | විෂයය අංකය | සමත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | | 1. | | |
| | | 2. | | |
| | | 3. | | |
| | | 4. | | |
| | | 5. | | |
| | | 6. | | |
| | | 7. | | |
| | | 8. | | |
| | | 9. | | |
| | | 10. | | |
| | | 11. | | |

(ආ) *ගැසට්* නිවේදනයේ 3.1 ඡේදය අනුව සම්මාන සාමාර්ථයන් ලබා ගැනීම අනිවාර්ය කර ඇති විෂයයන් හතර පිළිබඳ විස්තරඃ

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයයන් | විෂයය අංකය | සමත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | | 1. සිංහල<br>2. ගණිතය<br>3. විද්‍යාව<br>4. කෘෂිකර්මය<br>5. සමාජ අධ්‍යයනය<br>6. ඉතිහාසය<br>7. ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය<br>8. කෘෂි ආහාර තාක්‍ෂණය<br>9. උද්‍යාන විද්‍යාව | | |

(ඇ) අ. පො. ස. (උ. පෙ.) විභාගය සඳහා ජීව විද්‍යා විෂය ධාරාව/තාක්‍ෂණවේදය විෂය ධාරාව හදාරා ඇත් ද?

| | | |
|---|---|---|
| ජීව විද්‍යා විෂය ධාරාව | | (අදළ කොටුව තුළ ✓ ලකුණු යොදන්න) |
| තාක්ෂණ වේදය විෂය ධාරාව | | |

*(ඇ)* අ. පො. ස. (උ. පෙළ.) විභාගයෙන් සමත් විෂයයන් :

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයයන් | විෂයය අංකය | සමත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | | 1. ජීව විද්‍යාව | | |
| | | 2. කෘෂිකර්මය | | |
| | | 3. භෞතික විද්‍යාව | | |
| | | 4. රසායන විද්‍යාව | | |
| | | 5. තාක්ෂණවේදය සඳහා විද්‍යාව | | |
| | | 6. කෘෂිකර්මය | | |
| | | 7. ජෛව තාක්ෂණවේදය | | |
| | | 8. ඉංජිනේරු තාක්ෂණවේදය | | |

*(ඉ)* ඉහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් ඉල්ලුම් පත්‍රයට අමුණා එවන්න. (මුල් පිටපත් එවිය යුතු නොවේ.)

අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් අමුණා තිබේ ද? :—————.

14. (i) දෙමව්පිය හෝ භාරකරුගේ නම සහ ලිපිනය :—————.
(සිංහලෙන්)

(ii) දෙමව්පිය හෝ භාරකරුගේ නම සහ ලිපිනය :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්)

15. මුදල් කුවිතාන්සි විස්තරය :
15.1 මුදල් කුවිතාන්සි අංකය :—————.
15.2 මුදල් කුවිතාන්සි නිකුත් කළ දිනය හා ශාඛාව :—————.

| |
|---|
| මුදල් කුවිතාන්සියේ උඩ කොටසේ තීරුවක පමණක් මැලියම් ගා මෙහි අලවන්න.<br>එහි ඡායා පිටපතක් අනිවාර්යෙන් ම ඔබ ළඟ තබාගන්න. |

*අයදුම්කරුගේ ප්‍රකාශය* :

මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති සියලුම විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මා අ. පො. ස. (සා. පෙළ) සමත් බවත්, සිංහල, විද්‍යාව, ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථයන් ඇති බවත්, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය හෝ ඉතිහාසය හෝ ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය හෝ කෘෂි ආහාර තාක්ෂණය හෝ උද්‍යාන විද්‍යාව යන විෂයන් හයෙන් එකකට සම්මාන සාමාර්ථයක් ඇති බවත් හා උසස් පෙළ ජීව විද්‍යා විෂය ධාරාව/තාක්ෂණවේදය විෂයය හදාරා *ගැසට්* නිවේදනයේ නම් කර ඇති සියලුම සුදුසුකම් සපුරා ඇති බවටත් සහතික වෙමි. මෙහි සඳහන් කරුණු අසත්‍ය බව හෝ වැරදි බව හෝ හෙළි වුවහොත්, මා තරග විභාගයට පෙනී සිටීමට හා කෘෂිකර්ම විද්‍යාලයට තෝරා ගැනීමට නුසුදුස්සකු වන බව මම දනිමි. මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති පිළිපැදීමට මම එකඟ වෙමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

**අධ්‍යාපන සුදුසුකම් හා අත්සන සහතික කිරීම**

(දෙපාර්තමේන්තුවක හෝ පාසලක ප්‍රධානියෙක්, සාමදාන විනිශ්චයකාරවරයෙක්, නීතිඥයෙක් හෝ රුපියල් 2,40,360 ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු විසින් මෙම අයදුම්පත්‍රය සහතික කළ යුතුයි.)

ඉහතින් අත්සන් කර ඇති ................................ මයා./මිය./මෙනෙවිය මා හොඳින් දන්නා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් යෙදූ බවත් මෙයින් සහතික කරමි. තව ද, ***ගැසට්* නිවේදනයේ සඳහන් අ. පො. ස. (සා. පෙළ) හා අ. පො. ස. (උසස් පෙළ) සුදුසුකම් සපුරා ඇති බවට *ගැසට්* නිවේදනය හා අධ්‍යාපන සහතිකවල මුල් පිටපත් පරීක්‍ෂා කර බලා වගකීමකින් යුතුව සහතික කරමි**. තව ද නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත මෙම ඉල්ලුම් පතෙහි අලවා ඇති බවත් සහතික කරමි.

————,
සුදුසුකම් සහතික කරන අයගේ අත්සන.
(නිල මුද්‍රාව).

දිනය :————.
නම :————.
නිල නාමය :————.
ලිපිනය :————.

06-65

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු.* | *ශ.* |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2017** | | | |
| **ජූනි** | 2017.06.02 | සිකුරාදා | 2017.05.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.06.09 | සිකුරාදා | 2017.05.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.06.16 | සිකුරාදා | 2017.06.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.06.23 | සිකුරාදා | 2017.06.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.06.30 | සිකුරාදා | 2017.06.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ජූලි** | 2017.07.07 | සිකුරාදා | 2017.06.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.07.14 | සිකුරාදා | 2017.06.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.07.21 | සිකුරාදා | 2017.07.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.07.28 | සිකුරාදා | 2017.07.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අගෝස්තු** | 2017.08.04 | සිකුරාදා | 2017.07.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.08.11 | සිකුරාදා | 2017.07.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.08.18 | සිකුරාදා | 2017.08.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.08.25 | සිකුරාදා | 2017.08.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.08.31 | බ්‍රහස්පතින්දා | 2017.08.18 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ. බ.*).

2017 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.